## සොබාදහම ඔබගේ ව්‍යාපාරයට වැදගත් වන්නේ ඇයි?



සොබාදහම් සහ වන සත්ව අත්දැකීම් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රමුඛත ම අංගයකි. බොහෝ සංචාරකයෝ එම අත්දැකීම් විඳ ගැනීමට ශ්‍රී ලංකාවට පැමිණෙති.



සොබාදහම සංරක්ෂණය කිරීම ඔබගේ ව්‍යාපාරයට සිදුකරන ආයෝජනයකි. එමගින් ඔබට වැඩි යමක් සංචාරකයින් හට ලබාදීමට හැකිවන අතර පොදුවේ ගත් විට ඔබගේ ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයට එමගින් සහයෝගයක් ලැබේ.



ඔබගේ ව්‍යාපාරය පරිසරය මත රඳා පවතී නම්, එය රැක ගැනීම වැදගත් වේ. ස්වභාවික සම්පත් අහිමි වුවහොත් හෝ ඒවාට හානි සිදු වුවහොත් එමගින් ඔබගේ ව්‍යාපාරයට සෘජු බලපෑමක් ඇතිකරන අතර, සමාජයට ද හානි පමුණුවයි. එවිට ඔබගේ වෙළෙඳපොළට අවදානමක් ඇති විය හැකිය.

## සොබාදහම රැක ගැනීම සඳහා ඔබට ගත හැකි අනෙකුත් ක්‍රියාමාර්ග

- ඔවුන්ට පත්‍රිකාවක් ලබා දීමෙන් හෝ ප්‍රතිඥාවක් ලබා දීමට ඔවුන් දිරිමත් කිරීමෙන් ඔබට මෙය කළ හැකිය.
- පරිසර සංරක්ෂණ ව්‍යාපෘති සඳහා මුදල් පරිත්‍යාග කළ හැකි වන පරිදි පරිත්‍යාග පෙට්ටියක් තැබීම මගින් ඔබගේ අමුත්තන් හට දායක වීමේ අවස්ථාවක් ලබා දෙන්න.
- ඔබගේ ගෙවත්තේ කෘත්‍රිම පොහොර භාවිත කිරීමෙන් වළකින්න.
- ශාක සහ සතුන් ඒවායේ ස්වභාවික පරිසරයෙන් ඉවත් කිරීමෙන් වළකින්න. රක්ෂිත ශාක සහ සත්ත්ව විශේෂ ආහාර ලෙස භාවිත කිරීමෙන්, ප්‍රදර්ශනයට යොදා ගැනීමෙන්, අලෙවි කිරීමෙන් හෝ ඒවායින් නිර්මාණය කරන ලද නිෂ්පාදන අලෙවි කිරීමෙන් වළකින්න.
- ඔබගේ පරිශ්‍ර තුළ සතුන් තබාගෙන සිටින්නේ නම්, ඔවුන් රැකබලා ගැනීම පිළිබඳ දේශීය සහ ජාත්‍යන්තර රෙගුලාසි සහ මාර්ගෝපදේශ අනුගමනය කරන්න.
- ආක්‍රමණශීලී විශේෂ පිළිබඳවත්, ඒවා හඳුනා ගැනීම සහ ඉවත් කිරීම පිළිබඳවත් ඔබගේ කාර්යමණ්ඩලය පුහුණු කරන්න.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) ප්‍රකාශයට පත් කළ 2018 වාර්ෂික සංඛ්‍යාන වාර්තාවට අනුව විදෙස් සංචාරකයින් මිලියන 1.1 ක් ශ්‍රී ලංකාවේ වන සත්ත්ව උද්‍යාන නැරඹීමට පැමිණ ඇති අතර, එමගින් ඇමරිකානු ඩොලර් මිලියන 12.3 (රුපියල් බිලියන 2) කට වැඩි ආදායමක් උපයා ඇත.**

### වැඩිදුර කියවීම්

සංචාරක කර්මාන්තය සොබාදහමටත්, ශාක සහ සතුන්ටත් ප්‍රතිලාභී වන්නේ කෙසේද

වන-සත්ත්ව සංචාරක කර්මාන්තයේ විස්මිත ප්‍රතිලාභ

සොබාදහම සඳහා ව්‍යාපාරික යෝජනාව

**ඔබ නොවේ නම්, කවුද? අදම 👉 ක්‍රියා කරන්න 🌳**
**තිරසාර ලෙස සිතන්න 🌎**

USAID Indo-Pacific Opportunity Project (IPOP)
International Development Group LLC

56/6A Horton Place
Colombo 7, Sri Lanka
Tel: 94-112697052

USAID
FROM THE AMERICAN PEOPLE

# සොබාදහම රැක ගැනීම සඳහා ඔබට කළ හැකි දේ



USAID
FROM THE AMERICAN PEOPLE

# සොබාදහම සංරක්ෂණය කිරීමට ඔබට කළ හැකි දේ

1. ශ්‍රී ලංකාවට ආවේණික ශාක වර්ග ඔබේ ඉඩමේ සිටුවන්න

2. ආක්‍රමණශීලී සතුන් සහ ශාක ගැන දැනුවත් වී ඒවා ඔබේ වටපිටාවෙන් ඉවත් කරන්න

3. ඔබේ අමුත්තන්ට නිර්දේශ කිරීමට හැකි වන පරිදි ඔබේ ප්‍රදේශයේ සංචාරක අත්දැකීම් අත්හදා බලන්න

4. ඔබේ ගොඩනැගිලි සහ වටපිටාව තුළ දුඹුරු සහ කොළ වැනි පරිසරය සමඟ මිශ්‍ර වන ස්වාභාවික වර්ණ භාවිතා කරන්න

5. ඔබේ අමුත්තන් වගකිවයුතු සංචාරකයින් වීමට දිරිමත් කරන්න. ස්වභාවධර්මයට ගරු කිරීමට සහ සතුන් සමඟ ක්‍රියා කිරිමේදි පිළිපැදිය යුතු පිළිවෙත් හා නීති රීති පිළිබඳව දැනුවත් කරන්න

6. සොබාදහම සහ සත්ව සංරක්ෂණය කෙරෙහි අවධානය යොමු කරන ව්‍යාපෘති සහ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වන්න

7. විවිධ මානව වනජීවී ගැටුම් සහ එවැනි තත්ත්වයන් සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඔබේ කාර්ය මණ්ඩලය දැනුවත් කරන්න



ගොඩනැගිල්ලක අව්ව සහිත පැත්තේ විශාල ගස් තුනක් හෝ වැඩි ගණනක් සිටුවීමෙන් සෙවණ ඇති කරයි. මෙය උණුසුම් කාල වලදී වායු සමීකරණ පිරිවැය 30% ක් දක්වා අඩු කරයි.

තෙත්බිම් සංරක්ෂණය කිරීම, ගංවතුර පාලනය කිරීමට සහ කුණාටු සඳහා බෆරයක් ලෙස ක්‍රියා කරයි, එය වසරකට හෙක්ටයාරයකට ඩොලර් 464 ක සාමාන්‍ය ආර්ථික ප්‍රතිලාභයක් ලබා දෙයි